ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| 13 ශ්‍රේණිය | 25 | S | B | යුරෝපා ඉතිහාසය - I, II | කාලය : පැය තුනයි විනාඩි 10 යි. |
|---|---|---|---|---|---|

අමතර කියවීම් කාලය - විනාඩි 10 යි.

## යුරෝපා ඉතිහාසය - I කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

❖ අංක 01 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නො ගැළපේ**. එම **නො ගැළපෙන** නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය **වරහන් තුළ ලියන්න.**

01. (1) රයින් (2) සේන් (3) ඩැනියුබ් (4) වොල්ගා (5) හඩ්සන් (.......)

02. (1) ඇතීනා (2) ජුපිටර් (3) මාර්ස් (4) වීනස් (5) මිනර්වා (.......)

03. (1) ඊස්කිලස් (2) ඇරිස්ටොෆනීස් (3) සොෆොක්ලීස් (4) යුරිපිඩීස් (5) පයිතගරස් (.......)

04. (1) රාජාණ්ඩුව (2) පූජක තන්ත්‍රය (3) ප්‍රජාතන්ත්‍රවාදය (4) ප්‍රජා පීඩක ආණ්ඩු (5) කතිපයාධිපති ආණ්ඩු (.......)

05. (1) ෆ්‍රෑන්ක්වරු (2) ලොම්බාර්ඩ්වරු (3) මායාවරු (4) විසිගොත්වරු (5) වැන්ඩල්වරු (.......)

06. (1) බොලොඤ්ඤා (2) අබෙලාර්ඩ් (3) පාදුවා (4) පැරිස් (5) ඔක්ස්ෆර්ඩ් (.......)

07. (1) රුසියන් (2) බොහිමියන් (3) ඩෙන්මාර්ක් (4) ස්වීඩන් (5) ප්‍රංශ (.......)

08. (1) කැලෝන් (2) ඩැන්ටන් (3) මිරාබෝ (4) රොබෙස්පියර් (5) මැරට් (.......)

09. (1) ජෝන් කැබෝ (2) මැගලන් (3) කෝර්ටේස් (4) පිසාරෝ (5) කොළොම්බස් (.......)

10. (1) ඩැග් හැමර්ෂල්ඩ් (2) යූරි ගාගාරින් (3) කර්ට් වොල්ඩ්හයිම් (4) ජේවියර් පේරෙස් ද කියුලර් (5) බූට්‍රෝස් ගාලි (.......)

❖ අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ.** එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) ඉලියඩ් - ඔඩිසි
(2) හෙරඩෝටස් - තුසිඩිඩීස්
(3) රොමියුලස් - රීමස්
(4) ලිවි - ටැසිටස්
(5) රෝමවරු - මිලේච්ඡයෝ (........)

12. (1) ස්පාඤ්ඤය - මැඩ්රිඩ්
(2) ප්‍රංශය - පැරිස්
(3) එංගන්තය - බර්මිංහැම්
(4) පෘතුගාලය - ලිස්බන්
(5) ඕලන්දය - ඇම්ස්ටර්ඩෑම් (........)

13. (1) ස්ටාර් චේම්බර් - හත්වන හෙන්රි
(2) අධර්ම මර්දනාධිකරණය - අටවැනි හෙන්රි
(3) අනභිභවනීය නාවික හමුදාව - දෙවන පිලිප්
(4) ලෙත්‍රේ ද කැචේ - දහ තුන්වැනි ලුවී
(5) මහද්වීපික ක්‍රමය - නැපෝලියන් බොනපාර්ට් (........)

14. (1) ලොලාර්ඩ්වාදීන් - එංගලන්තය
(2) හසයිට්වරු - බොහිමියාව
(3) කැල්වින්වාදීන් - ග්‍රීසිය
(4) ඇනාබැප්ටිස්ට්වරු - ජර්මනිය
(5) හ්‍යුගනෝවරු - ප්‍රංශය (........)

15. (1) අයිතිවාසිකම් පනත - උත්කෘෂ්ට විප්ලවය
(2) ස්වාධීනතා ප්‍රකාශය - ඇමෙරිකන් විප්ලවය
(3) මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශය - ප්‍රංශ විප්ලවය
(4) කොමියුනිට්ස් ප්‍රකාශනය - පැරිස් කොමියුනය
(5) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය - එක්සත් ජාතීන්ගේ සංවිධානය (........)

❖ අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ ප්‍රකාශන/ දින වකවානු සමූහයන් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම/ ප්‍රකාශන/ දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දී ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ. Y** තීරුරි **X** තීරුවය සමග නිවැරදිව ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග එහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන් තුළ** ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඇරිස්ටෝටල් | A | ආර්ථික විද්‍යාවේ පියා |
| (ii) | හිපොක්‍රටීස් | B | සමාජ විද්‍යාවේ පියා |
| (iii) | ක්ලයිස්තිනීස් | C | ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ පියා |
| (iv) | ඇඩම් ස්මිත් | D | බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා |
| (v) | කාල් මාක්ස් | E | දේශපාලන විද්‍යාවේ පියා |

(1) DECAB (2) CEABD (3) DAECB (4) AEBDC (5) EDCAB (........)

17.

| | X | | Y |
|---|---|---|---|
| (i) | බර්තලොමියු ඩයස් | A | බහමා දූපත් |
| (ii) | ක්‍රිස්ටෝෆර් කොලම්බස් | B | බ්‍රෙටන් තුඩුව |
| (iii) | ජෝන් කැබෝ | C | බ්‍රසීලය |
| (iv) | කබ්රාල් | D | ශුභ ප්‍රාර්ථනා තුඩුව |
| (v) | මාර්ක්විටේ | E | ක්විබෙක් |

(1) ECBAD (2) DABCE (3) BAEDC (4) EADCB (5) AEBDC (........)

18.

| | X | | Y |
|---|---|---|---|
| (i) | වර්සායි ගිවිසුම | A | බල්ගේරියාව |
| (ii) | ශාන්ත ජර්මේන් ගිවිසුම | B | තුර්කිය |
| (iii) | නියුලි ගිවිසුම | C | හංගේරියාව |
| (iv) | ට්‍රියනොන් ගිවිසුම | D | ජර්මනිය |
| (v) | ලොසෑන් ගිවිසුම | E | ඔස්ට්‍රියාව |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (........)

19.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ෂ්ලෙස්විග් | A | රතු රෝස් |
| (ii) | ඇල්සාස් | B | යෝර්ක් |
| (iii) | ලැන්කැස්ටර් | C | ටෝරි |
| (iv) | විග් | D | හොල්ස්ටයින් |
| (v) | සුදුරෝස | E | ලොරේන් |

(1) DECAB (2) CEABD (3) DEBCA (4) BEACD (5) EDACB (........)

| | | X | Y |
|---|---|---|---|
| 20. | (i) | ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) | A නිව්යෝර්ක් |
| | (ii) | ජාත්‍යන්තර අධිකරණය (ICJ) | B පැරිස් |
| | (iii) | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) | C ජිනීවා |
| | (iv) | එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO) | D රෝමය |
| | (v) | ලෝක ආහාර වැඩසටහන (WFP) | E හේග් |

(1) DCEAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (........)

❖ අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට **අදාළ අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. මුල්කාලීන දේශගවේශන කටයුතු**

(1) කොන්ස්තන්තිනෝපලයේ වැටීම දේශගවේශන ව්‍යාපාරය ඇති වීම කෙරෙහි බලපාන ලදි.
(2) පෘතුගාලය හා ස්පාඤ්ඤය මුල්කාලීන දේශගවේශන කටයුතුවල නිරත වූ යුරෝපා රාජ්‍යයන් දෙකකි.
(3) මැගලන්ගේ මුහුදු ගමන ලෝකය ගෝලාකාර බව සනාථ කළේ ය.
(4) දේශගවේශන කටයුතු සඳහා හයවන ඇලෙක්සැන්ඩර් පාප් වහන්සේ විසින් ප්‍රංශ හා ඉංග්‍රීසි ජාතිකයින්ට ලෝකය බෙදා දෙන ලදි.
(5) දේශගවේශනය නිසා යටත් විජිත අධිරාජ්‍යයන් බිහි කිරීමට යුරෝපා ජාතීන්ට හැකි විය. (........)

**22. තිස් අවුරුදු යුද්ධයේ ප්‍රධාන අවධි**

(1) බොහිමියන් (2) ජර්මන් (3) ඩෙනිෂ් (4) ස්විඩීෂ් (5) ප්‍රංශ (........)

**23. කාර්මික විප්ලව සමයේ සන්නිවේදන ක්ෂේත්‍රය**

(1) 1840 දි එංගලන්තයේ 'පෙනී තැපල් සේවය' ආරම්භ විය.
(2) විදුලි පණිවිඩ ක්‍රමය සොයාගත්තේ සැමුවෙල් මෝර්ස් විසිනි.
(3) ලොව ප්‍රථම විදුලි පණිවිඩය යවන ලද්දේ ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් ඩී.සී. නගරයේ සිට බැල්ටිමෝර් නගරය වෙත ය.
(4) ග්‍රැහැම්බෙල් විසින් දුරකථනය සොයා ගැනීම සන්නිවේදන ක්ෂේත්‍රයේ විශාල දියුණුවක් ඇති කිරීමට සමත් ව ඇත.
(5) ගුවන් විදුලිය සොයාගත් මාර්කෝනි බ්‍රිතාන්‍ය ජාතිකයෙකි. (........)

**24. ජර්මනිය එක්සත් කිරීම.**

(1) ප්‍රෂියානු නායකත්වය යටතේ සොල්වරීනය පිහිටුවීම.
(2) ඔස්ට්‍රියානු - සාර්ඩිනියානු යුද්ධය
(3) ෂ්ලෙස්විග් හා හොල්ස්ටයින් මුල්කරගෙන ඇති වූ යුද්ධයේ දී ඔස්ට්‍රියාව හා ප්‍රෂියාව විසින් ඩෙන්මාර්කය පරාජය කරනු ලැබීම.
(4) ඔස්ට්‍රියානු - ප්‍රෂියානු යුද්ධය
(5) ප්‍රංශ - ප්‍රෂියානු යුද්ධය (........)

**25. සීතල යුද්ධය සමයේ අභ්‍යවකාශ තරණය**

(1) අභ්‍යාවකාශ තරණය සීතල යුද්ධයේ කැපී පෙනෙන එක් අංශයක් විය.
(2) මිනිසා විසින් අභ්‍යවකාශයට යවන ලද ප්‍රථම කෘත්‍රිම චන්ද්‍රිකාව වන්නේ ස්පුට්නික් 01 (Sputnik 01) ය.
(3) අභ්‍යාවකාශයට ගිය ප්‍රථම ජීවියා වන්නේ ලයිකා බැල්ල ය.
(4) අභ්‍යාවකාශයට ගිය ප්‍රථම මිනිසා වන යූරි ගගාරින්ට නිරුපද්‍රිතව පෘථිවියට පැමිණීමට නොහැකි විය.
(5) සඳ තරණය මානව ඉතිහාසයේ විශාල පිම්මක් ලෙස සැලකේ. (........)

❖ අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම්................................................................ 1 ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම්................................................................ 2 ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම්................................................................ 3 ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම්................................................................ 4 ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම්.......... 5 ද **වරහන් තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය |

**26. පහත දැක්වෙන අයගෙන් රෝම ඉතිහාසඥයෝ කවරහු ද?**

(A) හොරස් (B) ටැසිටස්
(C) සාලස්ට් (D) ප්‍රොපර්ටියස් (........)

**27. ප්‍රති රෙපරමාදු ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) රෙපරමාදු ව්‍යාපාරය හමුවේ කතෝලික පල්ලියෙන් දැක් වූ ප්‍රතිචාරය ප්‍රති රෙපරමාදු ව්‍යාපාරය ලෙස හැඳින්වේ.
(B) ප්‍රති රෙපරමාදු ව්‍යාපාරය යටතේ ජේසු සංගමය පිහිටු විය.
(C) උල්රිච් ස්විංග්ලි ප්‍රති රෙපරමාදු ව්‍යාපාරයේ ප්‍රබල නායකයෙකු විය.
(D) අධර්ම මර්දනාධිකරණය ප්‍රති රෙපරමාදුවේ ප්‍රතිඵලයක් ලෙස අහෝසි විය. (........)

**28. ඇමරිකානු නිදහස් සටන සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) ජෝර්ජ් වොෂිංටන් ඇමරිකානු නිදහස් සටනේ දි මිය යන ලදි.
(B) නිදහස, සමානාත්මතාවය සහ සහෝදරත්වය ඇමරිකානු නිදහස් සටනේ සටන් පාඨය විය.
(C) ප්‍රංශ සෙන්පති ලෆායෙට් ජනපදවාසීන්ට සහය පල කරමින් ඇමරිකානු නිදහස් සටනට සහභාගි විය.
(D) ඇමරිකානු නිදහස් සටන ලොව ප්‍රථම ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවය ලෙස සැලකේ. (........)

**29. ඉතාලි එක්සත් ව්‍යාපාර සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) පාප් වහන්සේගේ බලය ඉතාලිය එක්සත් කිරීමට විශාල බාධාවක් විය.
(B) ජියෝබර්ට් ප්‍රමුඛ පිරිස පාප් වහන්සේගේ නායකත්වයෙන් ඉතාලිය එක්සත් කළ යුතු යැයි කියා සිටියහ.
(C) ප්ලොම්බියර්ස් ගිවිසුමෙන් තුන්වන නැපෝලියන් ඉතාලි එක්සත් ව්‍යාපාරයට අධාර දීමට එකඟ විය.
(D) කවුන්ට් කැවුර් එක්සත් ඉතාලියේ ප්‍රථම අගමැති විය. (........)

**30. පහත දැක්වෙන්නන් අතුරෙන් විසිවන සියවසේ අපරභාගයේ සෝවියට් දේශයේ පාලකයෝ කවරහු ද?**

(A) ඇලෙක්සි කොසිගින්
(B) ඇලෙක්සැන්ඩර් සොල්ෂෙනිට්සින්
(C) ලියොනිඩ් බ්‍රෙෂ්නෙෆ්
(D) අන්ද්‍රෙයි සඛරොෆ් (........)

❖ අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** යොදන්න.

**31. ඇතැන්ස්හි පාසල සිතුවම නිර්මාණය කරන ලද්දේ කවුරුන් ද?**

(1) රෆායෙල් සැන්සියෝ (2) මයිකල් ආංජීලෝ (3) ලියනාර්ඩෝ ඩාවින්චි
(4) සැන්ඩ්‍රෝ බොට්ටිසෙල්ලි (5) පැබ්ලෝ පිකාසෝ (........)

**32. එංගන්තයේ බලයට පත් අවසාන ටියුඩර් වංශිකයා කවුරුන් ද?**

(1) හත්වැනි හෙන්රි රජු (2) අටැවැනි හෙන්රි රජු (3) මේරි ටියුඩර් රැජිණ
(4) පළමුවන එළිසබෙත් රැජිණ (5) හයවැනි එඩ්වර්ඩ් රජු (........)

**33. පළමුවන ලෝක යුධ සමයේ ජර්මනිය හා රුසියාව අතර ඇති වූ ගිවිසුම කුමක් ද?**

(1) බ්‍රෙස්ට් ලිටොව්ස්කි (2) කුචුක් කයිනාජි (3) පෝස්ට්මත්
(4) ඇඩ්‍රියානෝපල් (5) මර්ජර් (........)

**34. රුසියාවට සමාජවාදය හඳුන්වාදුන්නේ කවුරුන් ද?**

(1) කාල් මාක්ස් (2) ලෙනිං (3) ප්ලේකානොව්
(4) ස්ටාලිං (5) කෙරෙන්ස්කි (........)

**35. නොබැඳි ජාතීන්ගේ ප්‍රථම සමුළුව පවත්වන ලද රාජ්‍ය කුමක් ද?**

(1) ඉන්දුනීසියාව (2) ඝානාව (3) ශ්‍රී ලංකාව
(4) ඉන්දියාව (5) යුගොස්ලාවියාව (........)

❖ අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1,2,3,4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ යොදන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දේ. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | පිළිතුර |
|---|---|---|---|
| **36** | ග්‍රීක චින්තනයේ සහ සංස්කෘතියේ කැපී පෙනෙන ලක්ෂණයක් නම් මානව තර්ක බුද්ධිය කෙරෙහි ඇති අවධාරණය සහ බුද්ධිවාදී සම්ප්‍රදායක් වර්ධනය කිරීමයි. | විද්‍යාව, දර්ශනය, කලාව, සාහිත්‍ය, දේශපාලනය, ඉතිහාස රචනය යන ග්‍රීක ශිෂ්ටාචාරයේ සෑම අංගයක් ම මානව තර්ක බුද්ධිය කෙරෙහි ග්‍රීකයන් තුළ තිබූ විශ්වාසය පෙන්නුම් කරයි. | (......) |
| **37** | ඇක්සිලේපියස්ගේ යෂ්ටිය ඇසුරෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිල ලාංඡනය නිර්මාණය කොට ඇත. | පුරාණ රෝම සමාජයේ සිටි ප්‍රභුවරුන් ''ප්ලේබියන්වරු ලෙස හඳුන්වන ලදි. | (......) |
| **38** | නිකලස් කොපර්නිකස් විසින් පෘථිවි කේන්ද්‍රවාදය ඉදිරිපත් කරන ලදි. | ප්‍රංශ විප්ලව සමයේ එරට ජනතාවගෙන් ලුණු සඳහා ගැබෙල් නමින් බද්දක් අය කරන ලදි. | (......) |
| **39** | නැපෝලියන් බොනපාර්ට් ගෙන් පසු ඔහුගේ සොහොයුරු තුන්වන නැපෝලියන් නමින් ප්‍රංශයේ බලයට පත් විය. | වියානා සම්මේලනයේ ප්‍රධාන න්‍යායාචාර්වරයා වූයේ මෙටර්නික් ය. | (......) |
| **40** | සමාජවාදය අගයමින් ඊජිප්තු ජනපති අබ්දුල් ගමාල් නසාර් විසින් සූවස් ඇල ජනසතු කරන ලදි. | සූවස් ඇළ ජනසතු කිරීම හේතු කොට ගෙන ඇති වූ අර්බුදය දෙවැනි වූයේ දෙවන ලෝක යුද්ධයට පමණි. | (......) |

# යුරෝපා ඉතිහාසය - 2024

## II කොටස

* **පළමුවන** ප්‍රශ්නය **අනිවාර්ය** වේ.
* **B** හා **C** කොටස් වලින් අවම වශයෙන් **එක** ප්‍රශ්නය බැගින් තෝරාගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
* **පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.

### A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) කොන්ස්තන්තිනෝපලය　　(ii) රයින් ගඟ　　(iii) සාර්ඩිනියා

(iv) ස්වීඩනය　　(v) කළු මුහුද　　(vi) ලන්ඩන්

(vii) ෂෙල්ස්විග්　　(viii) ඇතැන්ස්　　(ix) ලිස්බන්

(x) බෙල්ජියම　　(xi) ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය　　(xii) පෝලන්තය

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)*

### B කොටස

02. පහත දැක්වෙන ක්ෂේත්‍ර ඔස්සේ පුරාණ ග්‍රීක සංස්කෘතියේ විශේෂ ලක්ෂණ පරීක්ෂා කරන්න. *(ලකුණු 16)*

(i) ආගම　　(ii) දර්ශනය　　(iii) සාහිත්‍ය　　(iv) ගෘහ නිර්මාණ ශිල්පය

03. යුරෝපා ඉතිහාසයේ නව යුගයක් උදා වීම සඳහා දේශගවේශන ව්‍යාපාරයේ බලපෑම, දේශගවේශන ව්‍යාපාරයට බලපෑ හේතු හා එහි ප්‍රතිඵල ඇසුරින් සමාලෝචනය කරන්න. *(ලකුණු 16)*

04. **''කාර්මික විප්ලවය නිසා යුරෝපයේ ආර්ථික ක්ෂේත්‍රයේ පමණක් නොව දේශපාලන ක්ෂේත්‍රයේ ද විශාල වෙනසක් සිදු විය.''** කාර්මික විප්ලවය යන්න කෙටියෙන් නිර්වචනය කරන්න.

(i) කාර්මික විප්ලවය මුලින් ම භාජනය වූ කර්මාන්ත දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02)*

(ii) කාර්මික විප්ලවය එංගලන්තයෙන් ආරම්භ වීම සඳහා බලපෑ හේතු සැකෙවින් සඳහන් කරන්න. *(ලකුණු 06)*

(iii) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය විචාරාත්මක ව විමසන්න. *(ලකුණු 08)*

05. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පස්වන චාල්ස් අධිරාජ්‍යයා　　(ii) 1832 ප්‍රතිසංස්කරණ පනත

(iii) වෙස්ට්පේලියා සාම ගිවිසුම　　(iv) මයිකල් ආංජිලෝ　　*(එකකට ලකුණු 08 බැගිනි)*

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

## C කොටස

06. ''නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයේ අරමුණු හා පරමාර්ථ ඉදිරියට ගෙන ගියේ ය.''

(i) නැපෝලියන් බොනපාට් උපන් ස්ථානය කුමක් ද? *(ලකුණු 01)*

(ii) ඔහු සිය හමුදා අධ්‍යාපනය ලැබුවේ කොහේ දී ද? *(ලකුණු 01)*

(iii) ප්‍රංශ අධිරාජ්‍යයා බවට පත්වන තෙක් ඔහුගේ ප්‍රගමනය සැකෙවින් දක්වන්න. *(ලකුණු 06)*

(iv) නැපෝලියන් බොනපාට්ගේ දේශීය ප්‍රතිපත්තිය ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න. *(ලකුණු 08)*

07. (i) 1815 සිට 1848 දක්වා ඉතාලිය එක්සත් කිරීමට එරෙහිව පැවති බාධක කවරේ ද? *(ලකුණු 08)*

(ii) 1848 න් පසු එම බාධක ජයගෙන ඉතාලිය එක්සත් කරන ලද ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 08)*

08. (i) රුසියාවේ 1917 බෝල්ෂෙවික් විප්ලවය ඇති වීමට තුඩුදුන් හේතු විස්තර කරන්න. *(ලකුණු 08)*

(ii) බොල්ෂෙවික්වරුන්ගේ ජයග්‍රහණයට තුඩුදුන් හේතු විස්තර කරන්න. *(ලකුණු 08)*

09. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) බිස්මාර්ක් (ii) යුරෝපා සම්මේලන ක්‍රමය

(iii) ෆැසිස්ට්වාදය (iv) නොබැඳි ජාතීන්ගේ සංවිධානය *(එකකට ලකුණු 08 බැගින්)*



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!